# රාජ්‍ය සංස්ථාව හා භික්ෂු සංස්ථාව අතර සබඳතා

(ආරම්භයේ සිට පොළොන්නරු යුගය දක්වා)

යු . ජී . එච් . දේශප්‍රිය

FGS/HIST/MC/08/011

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
30 MAY 2011
UNIVERSITY OF KELANIYA

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ

ඉතිහාසය පිළිබඳ සමාජීය විද්‍යාපති

පර්යේෂණ උපාධි සඳහා

ඉදිරිපත් කරන ලදී.



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 684 |
| වර්ග අංකය | |



2010 ජූලි

# නිබන්ධ සාරාංශය

ක්‍රි. පූ. තුන්වන සියවසේ සිට පොළොන්නරු යුගය දක්වා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථාව හා භික්ෂු සංස්ථාව අතර සබඳතාවය පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේ අරමුණින් මෙම නිබන්ධය ඉදිරිපත් කර ඇත. ක්‍රි. පූ. තුන්වන සියවසේ මිහිඳු මාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රීලංකාවට බුදුදහම හඳුන්වාදීමත් සමඟ රාජ්‍ය සංස්ථාව හා භික්ෂු සංස්ථාව අතර ගොඩ නැගෙන සමීප සම්බන්ධතාවය ශ්‍රී ලංකාවේ ඉතිහාසය සම්බන්ධයෙන් සුවිශේෂී බලපෑමක් සිදුකර ඇත. රාජ්‍ය සංස්ථාව හා භික්ෂු සංස්ථාව අතර ගොඩනැගෙන සබඳතාවය මෙම නිබන්ධය තුළින් මාතෘකා කිහිපයක් ඔස්සේ සාකච්ඡාවට බඳුන් කර ඇත. එනම් පාලකයින් විසින් භික්ෂූන් වෙනුවෙන් ඉටුකරන ලද කාර්යභාරය, භික්ෂූන් විසින් පාලකයින් වෙනුවෙන් ඉටුකරන ලද කාර්යභාරය, පාලකයින් හා භික්ෂූන් වහන්සේලා අතර ගැටුම් හටගැනීම යන අවස්ථා ඉන් ප්‍රධාන වේ.

දේවානම්පියතිස්ස රජතුමා විසින් විවිධ ශාසනික කටයුතු කරමින් බුදුදහම ශක්තිමත් පදනමක පිහිටවූ අතර ඉන්පසු බලයට පත්වන අනෙකුත් පාලකයින් මෙම පූර්වාදර්ශය අනුව යමින් බුදුදහමේ දියුණුවට හා චිරස්ථිතියට සුවිශේෂී සේවාවක් කර ඇත. ඒ අනුව ආගමික ගොඩනැගිලි ඉදි කිරීම, සිව්පසයෙන් උපස්ථාන කිරීම, ආගමික උත්සව පැවැත්වීම ආදී විවිධ කටයුතුවල පාලකයින් නිරත වී ඇති අතර මෙකී නිබන්ධය තුළින් ක්‍රි.පූ. තුන්වන සියවසේ සිට පොළොන්නරු යුගය දක්වා ඒ ඒ පාලකයින් යටතේ සිදුවූ ආගමික සේවාව සාකච්ඡාවට බඳුන් කර ඇත. එමෙන්ම භික්ෂූන් වහන්සේලාගෙන් සිදුවූ සේවාව ද මෙරට රාජ්‍ය සංස්ථාව කෙරෙහි සුවිශේෂී බලපෑමක් කර ඇත. පාලකයින්ට උපදෙස් දීම, අධ්‍යාපනය ලබාදීම, ගැටුම් සමතයකට පත් කිරීම ආදී විවිධ කටයුතු තුළින් මෙරට සදාචාරාත්මක හා දැහැමි පාලනයක් ඇති වීමට අවශ්‍ය මූලික වාතාවරණය ඇති විය. මේ ආකාරයට රාජ්‍ය සංස්ථාව හා භික්ෂු සංස්ථාව අතර සමීප සබඳතාවයක් පැවතියා සේම ඇතැම් අවස්ථාවල ගැටුම් ද ඇතිවිය. එහි වැදගත් අවස්ථාවක් ලෙස මහසෙන් රජතුමාගේ අවධිය සඳහන් කළ හැකිය.

ඒ අනුව ක්‍රි. පූ. තුන්වන සියවසේ සිට පොළොන්නරු යුගය දක්වා රාජ්‍ය සංස්ථාව හා භික්ෂු සංස්ථාව අතර ගොඩනැගෙන සබඳතාවයෙහි විවිධ පැතිකඩ පිළිබඳ මෙකී නිබන්ධය තුළින් සාකච්ඡා කර ඇති අතර අවසාන වශයෙන් මෙම සබඳතාවය ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් කවර බලපෑමක් කිරීමට සමත්වීද පිළිබඳ කරුණු සාකච්ඡා කර ඇත.